**සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2026 වර්ෂය**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -ගාල්ල**

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 සඳහා 2026 වර්ෂය තුළ පහත දැක්වෙන වැඩ, සැපයුම් හා සේවාවන් වෙනුවෙන් සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම පිණිස අයදුම්පත් 2025.11.03 දින සිට 2025.12.01 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

**<u>සැපයුම්</u>**

විෂය අංකය හා විෂය විස්තරය

1. ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා (පරිගණක කඩදාසි,රෝනියෝ කඩදාසි, ෆැක්ස් රෝල් ඇතුළුව සී.ඩී, ප්‍රින්ටර් ටෝනර්, ප්‍රින්ටර් රිබන්, ෆොටෝ කොපි කාට්රිජ් ආදිය)
2. කාර්යාලීය උපකරණ (මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ඩිජිටල් ඩුප්ලෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ප්‍රොජෙක්ටර් සහ ප්‍රෝජෙක්ටර් තිර ආදිය)
3. කාර්යාලීය ගෘහ භාණ්ඩ (දැවමය, වානේ හා ප්ලාස්ටික්)
4. පරිගණක, පරිගණක උපාංග හා ජාලකරණ උපාංග
5. ගෘහ/විදුලි උපකරණ (රූපවාහිනි, මහන මැෂින්, ශීතකරණ,රෙදිසෝදන යන්ත්‍ර ආදි)
6. විදුලි ජනක යන්ත්‍ර
7. දොර ජනෙල් හා ඇඳ ඇතිරිලි, නිල ඇඳුම් සඳහා රෙදි
8. රූපලාවන්‍ය උපකරණ
9. කාර්යාලීය බෑග්
10. පාසල් උපකරණ (බෑග්/ සපත්තු ආදිය)
11. ක්‍රීඩා භාණ්ඩ හා කාය වර්ධන උපකරණ
12. සංගීත භාණ්ඩ (පෙරදිග/අපරදිග)
13. වාහන සඳහා ටයර්, ටියුබ් හා බැටරි හා වීල් එලයිමන්ට්
14. වාහන අමතර කොටස්
15. සියලුම වර්ගයේ ගොඩනැගිලි ද්‍රව්‍ය (ඉදි කිරීම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය/විදුලි උපාංග/වීදි ලාම්පු/ ජලනල උපාංග ආදිය)
16. බෝතල් කළ පානීය ජලය හා ජල සැපයුම (ජල පෙරන ) උපකරණ සැපයීම.
17. ඉදිකිරීම් හා කාර්මික යන්ත්‍ර සූත්‍ර (ග්‍රිල්/ ග්‍රයින්ඩර්/ වතුර මෝටර්/ තණකොළ කපන මැෂින් ආදිය)
18. ධීවර ආම්පන්න (කරදිය/මිරිදිය)
19. වායුසමන යන්ත්‍ර
20. CCTV කැමරා පද්ධති
21. ශබ්ද විකාශන පද්ධති හා ශබ්ද විකාශන උපකරණ
22. කාර්යාල හැඳුනුම්පත් සකස් කිරීම
23. කෘෂි උපකරණ
24. බිම්මල් කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය
25. අභ්‍යන්තර දුරකථන පද්ධති
26. පුස්තකාල පොත්
27. ළමා උද්‍යාන, විනෝද උයන් සඳහා වන උපකරණ (ඔන්චිල්ලා/ලිස්සන බෝට්ටු/ සීසෝ ආදිය)
28. පැල හා බීජ වර්ග (බිත්තර වී/වැවිලි භෝග/ පළතුරු/එළවළු පැල හා මල් පැල ආදිය)
29. මුළුතැන්ගෙයි උපකරණ (බුෆේ සෙට්/ඇළුමිනියම් භාණ්ඩ/ පෝසිලේන් භාණ්ඩ/ වීදුරු භාණ්ඩ ආදිය)
30. සතුන් (එළුවන්/කුකුළන්/ගවයන් ආදී)
31. සමර් හට් හා කැනපි මඩු
32. තිර රෙදි හා දොර ජනෙල් රෙදි මැසීම

33. විවිධ ගෘහ කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ (තුනපහ ඇඹරුම් යන්ත්‍ර/ඉදි ආප්ප මැෂින්/ස්ටීමර්/පොලිතින් සීලර්/ ඉලෙක්ට්‍රික් තරාදි ආදී...)
34. සෞඛ්‍යාරක්ෂිත උපකරණ හා රසායනික ද්‍රව්‍ය
35. හස්ත කර්මාන්තය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය (මැටි,වේවැල්,විසිතුරු භාණ්ඩ)
36. පන් සැපයුම්කරුවන්
37. ලණු මැෂින් හා ලණු ආශ්‍රිත නිෂ්පාදන සැපයුම්කරුවන්
38. බේකරි කර්මාන්ත ආශ්‍රිත උපකරණ
39. කිතුල් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන හා උපකරණ
40. වෙස් මුහුණු කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන හා යන්ත්‍රෝපකරණ
41. කොන්ක්‍රීට් කණු / මල් පෝච්චි සහ අච්චු / කොම්පොස්ට් බඳුන්
42. දැව සැපයුම්කරුවන්
43. වඩු කර්මාන්ත ආශ්‍රිත යන්ත්‍ර සූත්‍ර හා උපකරණ හා අමුද්‍රව්‍ය
44. සෙරමික් භාණ්ඩ වර්ග නිෂ්පාදන සැපයුම්කරුවන්
45. කිරුම් මිණුම් උපකරණ සැපයුම්කරුවන්
46. අත් යන්ත්‍ර නූල් හා යන්ත්‍රෝපකරණ සැපයුම්කරුවන්

<u>**සේවාවන්**</u>

විෂය අංකය හා විෂය විස්තරය

47. වාහන අලුත්වැඩියාව } ගාල්ල දිස්ත්‍රික්කය තුළ පමණක් විය යුතුය.
48. වාහන සේවා කිරීම
49. වාහන ෂීට් කවර දැමීම හා කුෂන් කිරිම
50. වාහන විදුලි පද්ධති ස්ථාපනය කිරිම, වාහන ස්ටිකර් කිරිම, Audio/Video රෙකෝඩර්, පසුපස කැමරා, දුරස්ථ පාලක අළුත්වැඩියා කිරීම් ආදිය
51. වාහන වායුසමීකරණය කිරීම
52. මුද්‍රණ කටයුතු හා පොත් බැඳීම
53. රබර් මුද්‍රා, නාම පුවරු, ලාංජන, බැනර් ඇඳීම, සමරු ඵලක හා ගල් කැටයම් සැකසීම
54. කාර්යාල පවිත්‍රතා හා සනිපාරක්ෂක සේවා සැපයීම
55. කාර්යාලීය ලී බඩු, කුෂන් පුටු අලුත්වැඩියා කිරීම හා කුෂන් කිරිම
56. පරිගණක හා ආශ්‍රිත උපාංග අලුත්වැඩියා කිරීම
57. ලැප්ටොප් පරිගණක, මල්ටිමීඩියා ප්‍රෝජෙක්ටර්, මල්ටිමීඩියා ප්‍රෝජෙක්ටර් තිර හා ඒ ආශ්‍රිත උපකරණ කුලී පදනම මත සැපයීම
58. ආරක්ෂක සේවා සැපයීම
59. වෑද්දුම් කිරීම (ඇලුමීනියම්,යකඩ,පිත්තල,ප්ලාස්ටික් ආදිය)
60. මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ඩිජිටල් ඩුප්ලෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, යතුරු ලියන යන්ත්‍ර ආදී සියලුම කාර්යාල උපකරණ අලුත්වැඩියාව හා සේවා කිරීම
61. විදුලි පද්ධති වැඩිදියුණු කිරීම හා අලුත්වැඩියා කිරීම
62. වායුසමන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
63. විදුලි ජනන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
64. විදුලි සෝපාන අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
65. CCTV කැමරා පද්ධති අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
66. ශබ්ද විකාශන පද්ධති අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
67. ගිනි ආරක්ෂණ පද්ධති නඩත්තුව හා සේවා කිරීම
68. විදුලි ආලෝකකරණ උපාංග හා සේවාවන්
69. උත්සව භාණ්ඩ සැපයීම (මේස, පුටු,කැනපි මඩු,වේදිකා)
70. ආහාර පාන සැපයීම (උදේ,දිවා,රාත්‍රී ආහාර/බේකරි ආහාර/රස කැවිලි/පළතුරු ආදි)
71. නර්තන කණ්ඩායම් සැපයීම
72. තිර රෙදි හා දොර ජනෙල් රෙදි පිරිසිදු කිරීම

73. නළ ලිං ඉදිකිරීම
74. ඇලුමිනියම් ආශ්‍රිත සේවා සහ අළුත්වැඩියා කිරිම (පාටිෂන් කිරිම,ජනෙල් දොරවල්, සෝකේස්, සිවිලිම්, පැන්ට්‍රි කබඩ් ආදි)
75. ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය වාහන, යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය කුලී පදනම මත සැපයීම
76. වාහන කුලී පදනම මත සැපයීම (කාර්, වෑන්, ඩබල් කැබ්, ලෝරි, බස් රථ ආදීය)
77. සංචාරකයින් සඳහා ආහාර පාන හා නවාතැන් පහසුකම් සැපයීම

**<u>ඉදිකිරීම් හා සංවර්ධන</u>**

විෂය අංකය හා විෂය විස්තරය

78. ගොඩනැගිලි ඉදිකිරීම, වැඩි දියුණු කිරීම හා අලුත්වැඩියා කිරීම (CIDA ආයතනයේ ලියාපදිංචි ආයතන)
79. මාර්ග සංවර්ධනය හා අලුත්වැඩියා කිරීම (CIDA ආයතනයේ ලියාපදිංචි ආයතන)
80. ක්‍රීඩා පිටි හා ක්‍රීඩාගාර සංවර්ධන කටයුතු (CIDA ආයතනයේ ලියාපදිංචි ආයතන)
81. ජලාශ හා වාරි මාර්ග සංවර්ධන කටයුතු (CIDA ආයතනයේ ලියාපදිංචි ආයතන)
82. නව පාලම් ඉදි කිරිම හා පාලම් අළුත්වැඩියා කිරිම (CIDA ආයතනයේ ලියාපදිංචි ආයතන)

**<u>උපදෙස් සහ කොන්දේසි</u>**

1. අයදුම්පත 240mm X 297mm (A4) ප්‍රමාණයේ කඩදාසියක පහත සඳහන් තොරතුරු අනිවාර්යෙන්ම ඇතුලත් වන ලෙස ඔබ විසින් සකස් කර ගත හැකිය. නොඑසේ නම් එම **අයදුම්පත 2025 දෙසැම්බර් 01** වන දින දක්වා රාජකාරී දිනයන්හීදී පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කළමනාකරණ අංශයෙන් ලබා ගත හැකිය. එසේත් නැතිනම් www.galle.dist.gov.lk Downloads යටතේ භාගත කර ගත හැකිය.

1.1 ව්‍යාපාරයේ /කොන්ත්‍රාත්කරුගේ /සැපයුම්කරුගේ නම - ..........................

1.2 ලිපිනය- ...................................

1.3 ලියාපදිංචි අංකය-...............(ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කල යුතුය.)

1.4 දුරකථන අංකය - ............. ෆැක්ස් අංකය - ................
WhatsApp අංකය - .......................................... ඊ මේල් ලිපිනය -................................

1.5 මුදල් කුවිතාන්සියෙහි / Govpay ලදුපතෙහි අංකය හා දිනය - ....................

1.6 ව්‍යාපාරයේ ස්වභාවය (නිෂ්පාදිත/නියෝජිත/සමූපකාර) - ..........................

1.7 දකුණු පළාත තුල ප්‍රධාන ශාඛා පිහිටුවා ඇත්නම් ඒවායේ විස්තර
(ලිපිනය , සම්බන්ධ වන පුද්ගලයන්, දුරකතන අංකය) - ............................

1.8 ලියාපදිංචි වීමට අපේක්ෂිත භාණ්ඩ හා සේවාවේ,
1.8.1 විෂය අංක- .........................
1.8.2 විෂය විස්තර- ................................

1.9 භාණ්ඩයේ වෙළඳ නාමය - .............................

1.10 වැට් අංකය- ............................

1.11 දෙනු ලබන ණය කාල සීමාව (සැපයුම්කරුවන්) – ............................

1.12 CIDA ආයතනයේ ලියාපදිංචි අංකය හා ශ්‍රේණිය (කොන්ත්‍රාත්කරුවන් සඳහා) - (CIDA ආයතනයේ ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කල යුතුය.)

1.13 දිනය හා සැපයුම්කරුගේ / කොන්ත්‍රාත්කරුගේ අත්සන හා නිල මුද්‍රාව

2. සියලුම අයදුම්පත් 2025.12.01 දින ප.ව 3.00 ට පෙර දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කළමණාකරණ අංශය වෙත ගෙනවිත් භාරදිය හැකිය.

3. අයදුම්පත ඇතුළත් ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **<u>සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2026 වර්ෂය</u>** යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

4. සෑම අයදුම්පතක් සමඟම ආපසු නොගෙවන ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු.750.00 ක මුදලක් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත ගෙවීමෙන් ලබා ගන්නා මුදල් කුවිතාන්සියක් අමුණා තිබිය යුතුය. එසේ නැතහොත් Govpay හරහා ගෙවීම් කර ලබා ගන්නා රිසිට්පත අයදුම්පත සමඟ එවිය යුතුය.( Govpay හරහා ගෙවීම් සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා www.govpay.lk වෙත පිවිසෙන්න)

5. අයදුම්පත සමඟ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර ඔබගේ ව්‍යාපාර ක්ෂේත්‍රයට අදාලව ලබාගත යුතු වෙනත් රජයේ ලියාපදිංචි / අවසර සහතික වේ නම් එම සහතික වල පිටපතක් ද ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. තවද CIDA ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් එම ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර එය යාවත්කාලීන විය යුතුය.

6. මිලදී ගන්නා ද්‍රව්‍ය / භාණ්ඩ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට නොමිලේ ප්‍රවාහනය කර දිය යුතුය.

7. වැඩ/සැපයුම්/සේවා ලබා ගැනීම අවශ්‍ය වූ විටක ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන අතර තරඟකාරී මිල ගණන් ලබා ගැනීම අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවලදී වෙනත් සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් ද මිල ගණන් ලබා ගැනීමේ අයිතිය මා සතුය.

8. මිල ගණන් කැඳවීමේදී මිල ගණන් ඉදිරිපත් නොකරන, ඇණවුම් කළ විට නියමිත වේලාවට, සාම්පල් වලට අපේක්ෂිත ගුණාත්මකභාවයෙන් යුතු භාණ්ඩ හා සේවාවන් නොසපයන ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ /කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලියාපදිංචි නාම ලේඛනයෙන් කපා හැරීමේ බලය මා සතුය.

9. ලියාපදිංචි වීම සඳහා එවනු ලබන අයදුම්පත් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතුය.

10. ඉහත කරුණු පිළිබඳව වැඩිදුර පැහැදිලි කිරීම් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කළමණාකරණ අංශය වෙතින් දුරකථන අංක 0912222233 (දිගුව 210) අමතා ලබාගත හැකිය.

11. 2026 වර්ෂයේ සිට Electronic Government Procurement (EGP) System හරහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරන බැවින් www.promise.lk වෙත පිවිස සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වන ලෙසද දැනුම් දෙමි.

ඩබ්.ඒ. ධර්මසිරි,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය.
2025.11.03